ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන- හයවන මට්ටම 2022/2023

අවසාන පරීක්ෂණය 2023

SNU6212 - අන්තර්කරණ අධ්‍යාපනය

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.11.17 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ සංකල්පය ඔබේ වචනවලින් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ලෝක සෞඛ්‍ය සංවිධානයට (WHO) අනුව බාධිතබව නිර්වචනය කර ඇත්තේ කෙසේදැයි උදාහරණයක් ඇසුරෙන් විස්තර කරන්න.

03. සුහග හා සහජ දක්ෂතා සහිත දරුවන්ගේ ගති ලක්ෂණ පහක් (05) නම් කරන්න.

04. අන්තර්කරණ පන්ති කාමරයක ගුරුවරයෙකු ලෙස ඔබට කියවීමේ දුෂ්කරතා සහිත දරුවන් හඳුනා ගතහැකි ලක්ෂණ කෙසේ ද? උදාහරණයක් සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ගුරුවරුන් සඳහා දෘෂ්ටි තීව්‍රතාව සහ දෘෂ්ටිඌනතා පිළිබඳ දැනුම වැදගත් වන්නේ ඇයි? කෙටියෙන් සාකච්ඡා කරන්න.

06. අන්තර්කරණ පන්තිකාමරයක සේවය කරන ගුරුවරුන් ලෙස ඔවුන්ගේ ප්‍රධාන භූමිකා පහක් (05) සඳහන් කර ඒවායින් එකක් (01) උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

07. දුබලතා සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනයේ ප්‍රතිලාභ පහක් (05) සඳහන් කරන්න.

08. අන්තර්කරණ පන්තිකාමරයක විවිධත්වය යන්නෙහි තේරුම උදාහරණ දෙකක් (02) සමග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයකු ලෙස, ඔබ ශ්‍රවණ ඌනතා සහිත සිසුන් හඳුනා ගන්නේ කෙසේ ද? උදාහරණ දෙකක් (02) මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. ශ්‍රවණ පද්ධතියේ පිටත කන, මැද කන සහ අභ්‍යන්තර කන ආශ්‍රිත ප්‍රධාන ඇසීමේ දෝෂ විස්තර කරන්න. (ලකුණු 07)

iii. අන්තර්කරණ පන්ති කාමරයක ගුරුවරයකු ලෙස උග්‍ර ඇසීමේ දෝෂ සහිත සිසුන්ට පහසුකම් සැලසීම සඳහා උපාය මාර්ග හතරක් (04) නිර්මාණය කරන්න. (ලකුණු 08)

10. i. ඔබ, අන්තර්කරණ අධ්‍යාපනය කෙරෙහි නිෂේධාත්මක ආකල්ප ඇති විදුහල්පති සහ කාර්ය මණ්ඩලයක් සහිත පාසලක ගුරුවරයෙකු යැයි සිතන්න. අන්තර්කරණ අධ්‍යාපන පිළිබඳ ඔවුන්ගේ නිෂේධාත්මක ආකල්ප ඔබ හඳුනාගන්නේ කෙසේ ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 05)

ii. ඔවුන්ගේ නිෂේධාත්මක ආකල්ප ධනාත්මක ලෙස වෙනස් කිරීමට ඔබ භාවිත කිරීමට යන සුදුසු ප්‍රවේශයන්/ක්‍රම පහක් (05) සුදුසු උදාහරණ සහිත ව යෝජනා කරන්න. (ලකුණු 07)

iii. පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාව නොමැතිකම ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය තුළ අන්තර්කරණ අධ්‍යාපන ක්‍රම වැඩිදියුණු කිරීමට බාධාවක් නිර්මාණය කරයි. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ ද නැද්ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

11. i. විෂයමාලා අනුවර්තනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. ළමුන්ගේ විවිධ අවශ්‍යතා අනුව ඉඩ සැලසීම හා අනුවර්තනය කිරීම සඳහා අන්තර්කරණ පන්තිකාමරවල ගුරුවරුන්ට විෂයමාලා අනුගත කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 07)

iii. ඔබ ශ්‍රී ලංකාවේ රජයේ පාසලක අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයෙක් ලෙස පන්ති කාමරයේ විවිධ අවශ්‍යතා සඳහා විෂයමාලා අනුවර්තනය කිරීමේ දී මුහුණ දෙන අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. i. අන්තර්කරණ පන්තිකාමරයක සිසුන් අතර පවතින විවිධ අවශ්‍යතා පහක් (05) ගවේෂණය කරන්න. (ලකුණු 05)

ii. අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයකු ලෙස, සැමට අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි බාධා මොනවා ද? සුදුසු උදාහරණ සමඟ මෙම බාධක කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 07)

iii.අන්තර්කරණ පන්තිකාමරයක උගන්වන ගුරුවරයකු ලෙස ඔබ ඉහත බාධක ජය ගැනීම සඳහා විසඳුම් යෝජනා කරන්න.(කරුණාකර අවම වශයෙන් විසඳුම් හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

13. i. ඌන අවධාන අධි ක්‍රියාකාරී අක්‍රමතාව (ADHD) යන යෙදුම ඔබේ වචනවලින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. . ඌන අවධාන අධි ක්‍රියාකාරී අක්‍රමතාව (ADHD) හේතුවෙන් පන්තිකාමරය තුළ සිසුන් දුර්වල ශාස්ත්‍රීය හැකියාවන් පෙන්නුම් කරන්නේ මන්දැයි හේතු තුනක් (03) පරීක්ෂා කරන්න. (ලකුණු 07)

iii.ස්වභාවික විද්‍යාව උගන්වන ගුරුවරයකු ලෙස, අන්තර්කරණ පන්තිකාමර තුළ ඌන අවධාන අධි ක්‍රියාකාරී අක්‍රමතාව සහිත (ADHD) සිසුන්ගේ හැසිරීම කළමනාකරණය සඳහා ඉගැන්වීමේ ශිල්පීය ක්‍රම යෙදිය හැක්කේ කෙසේ ද?

ශිල්පීය ක්‍රම හතරක් (04) සමඟ විස්තර කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.